# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
# පොල් වගාකිරීමේ මණ්ඩලය
# තනතුරු පුරප්පාඩු

**පොල් වගාකිරීමේ මණ්ඩලය පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**(ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන )**
**සේවා ස්ථානය :- ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධියක්/ වැවිලි කළමනාකරණ උපාධිය සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂි විද්‍යා පශ්චාත් උපාධිධාරියකු වීම හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සමග

පිළිගත් ආයතනයක වසර 15ක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකාර (Managerial) මට්ටමේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් කාණ්ඩය** : HM 1-1
**වැටුප් පරිමාණය** : රු.140,640/- (4,100x15) – 202,140/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 123,019/- | රු. 140,640/- |

**වයස** : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුර : සහකාර සාමාන්‍යාධිකාරී IIශ්‍රේණිය**
**(පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ)**
**සේවා ස්ථානය :- ප්‍රධාන කාර්යාලය – තනතුරු 01**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී විශේෂ උපාධිය/ විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධිය/ ආර්ථික විද්‍යා විශේෂ උපාධිය/ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, කළමනාකරණය, සංවර්ධන පරිපාලනය, සංඛ්‍යානය විෂයක් සහිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධිය හා කළමනාකාර (Managerial) මට්ටමේ වසර 03ක අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද.

**වැටුප් කාණ්ඩය** : MM 1-3
**වැටුප් පරිමාණය** :රු.96,650/-(2,480x10) (3,450x15) 173,200/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 85,896/- | රු. 96,650/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : සහකාර සාමාන්‍යාධිකාරී(මූල්‍ය) IIශ්‍රේණිය**
**සේවා ස්ථානය :- ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/ වාණිජ්‍ය විශේෂ උපාධිධරයෙකු වීම හා කළමනාකාර (Managerial) මට්ටමේ වසර 03ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක්.

**වැටුප් කාණ්ඩය** : MM 1-3
**වැටුප් පරිමාණය** :රු.96,650/-(2,480x10) (3,450x15) 173,200/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 85,896/- | රු. 96,650/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : කළමනාකරු(මානව සම්පත් කළමනාකරණ)**
**IIශ්‍රේණිය**
**සේවා ස්ථානය :- ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණ උපාධිය/ ව්‍යාපාර කළමනාකරණ උපාධිය/ කළමනාකරණ උපාධිය/ රාජ්‍ය පරිපාලන උපාධිය/ වාණිජවේදී උපාධිය

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක සේවා පළපුරුද්ද.

**වැටුප් කාණ්ඩය** : MM1-1
**වැටුප් පරිමාණය** :රු.91,690/-(2,480x10) (3,450x15) 168,240/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 81,710/- | රු. 91,690/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : නේවාසික තවාන්භාර නිලධාරී IIIශ්‍රේණිය**
**සේවා ස්ථානය :- සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා**
**තනතුරු : 15**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය ආයතනයකින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) පහ (05) මට්ටමට නොඅඩුමට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප් කාණ්ඩය** : MA2-1
**වැටුප් පරිමාණය** :රු. 50,540/ - (540x10) (630x7) (890x4) (1,190x20) 87,710/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 46,960/- | රු. 50,540/- |

**වයස** : අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : කාර්මික සහකාර (සිවිල්) IIIශ්‍රේණිය**
**සේවා ස්ථානය :- ප්‍රධාන කාර්යාලය - තනතුරු 01**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික /වෘත්තීය ආයතනයකින් කාර්මික (සිවිල්) ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප් කාණ්ඩය** : MA2-1
**වැටුප් පරිමාණය** :රු. 50,540/ - (540x10) (630x7) (890x4) (1,190x20) 87,710/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 46,960/- | රු. 50,540/- |

**වයස** : අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර - පොල් සංවර්ධන සහකාර IIIශ්‍රේණිය**
**සේවා ස්ථානය - සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා**
**තනතුරු -15**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී,
i. සිංහල / දෙමළ භාෂාව
ii. ගණිතය
යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයයේදී විද්‍යා විෂයධාරාවෙන් හෝ කෘෂිකර්ම විෂය සහිතව අවම වශයෙන් විෂයන් 3ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 4ක් සමත්වී තිබීම අවශ්‍යවේ.)

**වැටුප් කාණ්ඩය** : MA1-1
**වැටුප් පරිමාණය** :රු. 46,220/- (540x10) (630x7) (890x4) (1,190x20) 83,390/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 43,312/- | රු. 46,220/- |

**වයස** : අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**(උක්ත තනතුරු සඳහා ජීවන වියදම් දීමනාව රු.17,800/- ඇතුළු තනතුරට අදාළ රජයේ අනෙකුත් දීමනා හිමි වේ.)**

**වෙනත් කොන්දේසි :-**

**බඳවාගැනීමේ ක්‍රමවේදය - පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි ඉල්ලුම්පත් කැඳවීමෙන් පසුව ලිඛිත තරඟ විභාගයක හා / හෝ පත්වීම් බලධාරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.**

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

අයදුම්පත් :

- **ඒ අනුව 2026.03.20 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් https://coconutsrilanka.lk/ වෙබ් අඩවිය වෙත පිවිස මාර්ග ගත ක්‍රමය හරහා අයදුම් කළ යුතු අතර, මාර්ග ගත අයදුම්පත් ක්‍රියාවලිය 2026.03.06 දින සිට විවෘත වන අතර 2026.03.20 දිනෙන් අවසන් වේ. එසේ මාර්ග ගත ක්‍රමය ඔස්සේ යොමු කළ පසු එය තම විද්‍යුත් තැපැල හරහා බාගත කර අදාළ උඩ පිටපත** අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

- **එමෙන්ම එසේ මාර්ග ගත ක්‍රමයට අයදුම් කිරීමට අපොහොසත් අයදුම්කරුවකු සිටිනම් ඉහත වෙබ් අඩවිය වෙත පිවිස එහි ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් සුදුසු ආකෘතියක් භාවිතා කර ගෙන එය අදාළ තනතුර සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් යොමුකළ යුතුවේ.** එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේනම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.

- සියලුම අයදුම්පත් 2026.03.20 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**සභාපති**
**පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**